# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2351/07 - 2023 සැප්තැම්බර් මස 25 වැනි සඳුදා - 2023.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 39(3) 40 වන වගන්ති සමග කියවිය යුතු පනතේ 41 වන වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**රොෂාන් රණසිංහ** (පා. ම.),
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2023 සැප්තැම්බර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

එක් එක් ක්‍රීඩාවේ ප්‍රවර්ධනය, ස්වාධීනත්වය සහ විනිවිදභාවය ආරක්ෂා කිරීම උදෙසා ශ්‍රී ලංකාවේ මෙතෙක් ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි වී ඇති සහ ලියාපදිංචි කිරීමට ඇති ක්‍රීඩාවන්ට අදාළව ජාත්‍යන්තර ක්‍රීඩා සංගම් / සම්මේලන, දේශීය ක්‍රීඩා සංගම් / සම්මේලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය සම්බන්ධීකරණය කිරීම සඳහා පහත පරිදි නියෝග සාදනු ලැබේ.

ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයක දී ක්‍රීඩා ක්ෂේත්‍රය සම්බන්ධව ශ්‍රී ලංකාව නියෝජනය කරනු ලබන ඕනෑම කටයුත්තක් වෙනුවෙන්, ජාත්‍යන්තර ක්‍රීඩා සංගම් හෝ සංවිධාන සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරීම අරමුණු කරගෙන එක් එක් ක්‍රීඩාව සඳහා, ඒ ඒ ක්‍රීඩාව සම්බන්ධව දැනුම සහිත එක් පුද්ගලයෙකුගෙන් හෝ පුද්ගලයින් කිහිප දෙනෙකුගෙන් සැදුම්ලත් "ශ්‍රී ලංකාවේ, ජාත්‍යන්තර ක්‍රීඩා සම්බන්ධීකරණ කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන කමිටු විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කළ හැකිය.

EOG - 09 - 0215

1A - G 40384 — 07 (2023/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*